වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ஆண்டிற்கான செயற்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2025

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்

Land Commissioner General's Department

පටුන

පිටු අංක

1. පරිච්ඡේදය - ආයතන පැතිකඩ **5- 8**
1.1 හැඳින්වීම
1.2 දැක්ම, මෙහෙවර, අරමුණු
1.3 ප්‍රධාන කාර්යයන්
1.4 සංවිධාන සටහන
1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම **9- 13**
2.1 ප්‍රගතිය
2.2 විශේෂ වැඩසටහන්
2.3 ඉදිරි ඉලක්ක

3. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය **14- 21**
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
3.4 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය
3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය
3.6 මු.රෙ. 208 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය
3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

4. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක **22**
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

5. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය **23**
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු
5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ **24 - 27**
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය
6.2 මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය
6.3 මානව සම්පත් සංවර්ධනය

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව **28 - 34**

1. පරිච්ඡේදය
ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත, රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යන පනත් මගින් රජයේ ඉඩම් හා සම්බන්ධ ඉඩම් කච්චේරි පැවැත්වීම, අඩු ආදායම්ලාභී පුද්ගලයන් වෙත නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබා දීම, බලපත්‍ර ලබා දීම, දීමනා පත්‍ර ලබා දීම ආදී කටයුතු මෙන්ම වැඩි ආදායම් පුද්ගලයන් සහ විවිධ ආයතන වෙත ද කෘෂිකාර්මික සහ වාණිජමය ආදී අවශ්‍යතාවයන් සඳහා දීර්ඝකාලීන බදු කර මෙන්ම නිදහස් දීමනාපත්‍ර ලබා දීම, රජයේ ඉඩම් බැහැර කිරීමේ දී කටයුතු කිරීමට අදාළ රාජකාරී යනාදී කටයුතු රාශියක් මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදු කරනු ලබයි.

1.2 දෙපාර්තමේන්තු දැක්ම

"රාජ්‍ය ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස නිරවුල් බිමක් හිමි සමාජයක් බිහිකිරීම"

1.2.1. මෙහෙවර ප්‍රකාශය

"ජාතික ප්‍රතිපත්තියක් තුල මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනයේ චිරස්ථායී බව සහතික කරමින් රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කිරීමට මඟ පෙන්වමින් නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරීත්වයක් පවත්වා ගෙන යෑම"

1.2.2. දෙපාර්තමේන්තුවේ අරමුණු හා උපාය මාර්ග

අරමුණු	උපාය මාර්ග
1 ඉඩම් නොමැති ප්‍රජාවගේ ඉඩම් භුක්තිය ශක්තිමත් කිරීම.	i ඉඩම් හිමිකම තහවුරු කිරීම. ii රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු කළමනාකරණය කිරීම.
2 ආයෝජන අවස්ථා පුළුල් කිරීම.	i ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා රජයේ ඉඩම් උපයෝජනය කිරීම.
3 රජයේ ඉඩම් ප්‍රශස්ථ භාවිතය.	i රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් සංවර්ධනය කිරීම. ii රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම.
4 දෙපාර්තමේන්තුව සතු සම්පත් ප්‍රශස්ථව කළමනාකරණය කිරීම .	i මානව සම්පත සංවර්ධනය කිරීම. ii භෞතික සම්පත ඵලදායී ලෙස භාවිතා කිරීම. iii මූල්‍ය සම්පත විධිමත්ව කළමනාකරණය කිරීම.
5 රාජ්‍ය ආදායම වර්ධනය කිරීමට දායකවීම	i ඉඩම් ආදායම් හඳුනාගැනීම හා ඇස්තමේන්තු කිරීම ii ඉඩම් ආදායම් කාර්යක්ෂමව හා විධිමත්ව රැස්කිරීම. iii හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල පියවර ගැනීම.

1.3 රජයේ ඉඩම් පරිපාලනය තුල ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව රජයේ ඉඩම් බැහැර කිරීමේදී පහත සඳහන් සුවිශේෂී වූ කාර්ය භාරයන් ඉටුකරනු ලබයි.

1. අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණය කිරීම.
2. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම හා බෙදා දුන් ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම.
3. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම, මේ යටතේ
    - නිවාස, කෘෂිකාර්මික, කර්මාන්ත හා වාණිජ කටයුතු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීම.
    - විශේෂ හා නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීම.
    - විහාරස්ථාන සඳහා පූජා භූමි ඔප්පු නිකුත් කිරීම.
    - සුනාමි දීමනාපත්‍ර සකස් කිරීම.
    - රජයේ දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව හා පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කිරීම, බදු දීම හා පැවරීම.
    - නාගරික සංවර්ධන අධිකාරිය / නිවාස සංවර්ධන අධිකාරිය සඳහා පැවරුම් සකස් කිරීම.
4. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩම් බෙදාදීම හා නියාදන සාධන පත්‍ර ලබා දීම.
5. රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ රජයේ ඉඩම් හා රක්ෂිත ආරක්ෂා කිරීම.
6. අන්තර් පළාත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘති වලින් බැහැර රජයේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දීම.
7. රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණය කිරීම.
8. රාජ්‍ය බදු ආදායම් ශක්තිමත් කිරීමට රජයේ ඉඩම් මත බදු අයකර ගැනීම කළමනාකරණය කිරීම.
9. ඉඩම් ආරවුල් නිරාකරණය කිරීම.
10. මානව සම්පත් සංවර්ධන කටයුතු පවත්වා ගෙනයාම.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන



සුචිය

- නි.ඉ.කො. - නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්
- ස.ඉ.කො. - සහකාර ඉඩම් කොමසාරිස්
- පරි.නි. - පරිපාලන නිලධාරී
- ජ්‍යො.වැ.අධි. - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරී
- භාෂා පරි. - භාෂා පරිවර්තක

1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රාදේශීය කාර්යාල

මෙම දෙපාර්තමේන්තුවේ ඉඩම් සම්බන්ධ රාජකාරී කටයුතු ප්‍රධාන කාර්යාලයට අමතරව අන්තර් පළාත් වාරිමාර්ග ක්‍රම යටතේ පිහිටුවා තිබෙන්නා වූ ඉඩම් කොමසාරිස් කාර්යාල 06 ක් සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල 02 ක් යටතේද සිදු කරනු ලබයි.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

1. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - අනුරාධපුරය
2. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - පොළොන්නරුව
3. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - අම්පාර
4. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - ත්‍රිකුණාමලය
5. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - දෙබරවැව
6. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - මහියංගණය
7. සහකාර ඉඩම් කොමසාරිස් - සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය - කන්තලේ
8. සහකාර ඉඩම් කොමසාරිස් - සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය - මොණරාගල

1.5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඉඩම් I,ඉඩම් II,ඉඩම් III ලෙස පැවති ඉඩම් අංශයන් 2023 වර්ෂයේ අගෝස්තු මස ප්‍රතිව්‍යුහගත කරන ලදී.ඒ අනුව බදු අංශය, පර්යේෂණ හා සංවර්ධන අංශය,ප්‍රතිපත්ති හා විමර්ශන අංශය , පාලන අංශය, ගිණුම් අංශය හා අභ්‍යන්තර විගණන අංශය වශයෙන් අංශ 06 ක් ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාත්මක වේ. මෙයින් ඉඩම් අංශ තුනෙහි හා පාලන අංශයේ ප්‍රධානීන් ලෙස ඉඩම් කොමසාරිස්වරු කටයුතු කරනු ලබන අතර ගිණුම් අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන ගණකාධිකාරි ද, අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක ද කටයුතු කරනු ලැබේ.

2. පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

අංකය	ක්‍රියාකාරකම්		ඉලක්කය	සමස්ථ ප්‍රගතිය	සමස්ථ ප්‍රගතිය(%)
1	**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ**				
i	බලපත්‍ර සකස් කිරීම (අන්තර් පළාත්)	ගොවි පන්තිය	5500	2392	43.49
		ගැණුම් මිල	1150	492	42.78
	බලපත්‍ර සකස් කිරීම (පළාත් සභා)	ගොවි පන්තිය	24450	14989	61.30
		ගැණුම් මිල	3500	2021	57.74
ii	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම				
iii	දීමනා පත්‍ර පසු කටයුතු (පසු උරුමය නම් කිරීම, මුල් අයිතිය සහතික කිරීම, දීමනාපත්‍ර බැහැර කිරීම, උකස් කිරීම, කොන්දේසි ලිහිල් කිරීම)		2000	1221	61.05
iv	මධ්‍යම පාන්තික දීමනාපත්‍ර සකස් කිරීම		100	99	99.00
2	**රජයේ ඉඩම් ආඥා පනත යටතේ**				
i	බදු පදනම මත ඉඩම් ලබා දීම	බදු නිර්දේශ සකස් කිරීම	4000	3497	87.43
		බදුකර සකස් කිරීම	600	475	79.17
ii	නිදහස් දීමනාපත්‍ර සකස් කිරීම		1000	1034	103.40
iii	රජයේ ආයතන සඳහා ඉඩම් නිදහස් කිරීම	පැවරුම් නියෝග	150	59	39.33
		දෙපාර්තමේන්තු සඳහා ඉඩම් නිදහස් කිරීම	750	488	65.07
iv	පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර		40000	1	0.0
v	නාගරික සංවර්ධන අධිකාරිය / ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා ඉඩම් පැවරීම (දීමනා පත්‍ර)		50	25	50.00
vi	පූජා භූමි දීමනා පත්‍ර සකස් කිරීම (බෞද්ධ විහාරස්ථාන)		50	27	54.00
vi	සුනාමි දිමනාපත්‍ර සකස් කිරීම		100	758	758.00
3	**ඉඩම් ප්‍රදාන විශේෂ විධි විධාන පනත යටතේ**				
i	නියාදන සාදන පත්‍ර සකස් කිරීම		75	86	114.67
4	**ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම**		20	74	370.00
5	**කච්චේරි පැවැත්වීම**		150	311	207.33
6	**ගැටළුවලට උපදෙස් ලබාදීම හා ගැටළු නිරාකරණය**		15000	15072	100.48
7	**පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම**		34	46	135.29
8	**රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට දත්ත ඇතුළත් කිරීම**		70000	35070	50.10

2.2 විශේෂ වැඩසටහන්

2.2.1 රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

රාජ්‍ය සේවය ඩිජිටල්කරණය හරහා රජය සතු ඉඩම්වල කළමනාකරණ සහ පරිපාලනය මනා කාර්යක්ෂමතාවයකින් යුක්තව පවත්වාගෙන යාමේ අරමුණින් රජයේ ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය(e-Slims) හඳුන්වා දුන් අතර එමගින් රජය සතු ඉඩම් වල අයිතිය මනා කාර්යක්ෂමතාවයකින් සහ විනිවිදභාවයකින් යුක්තව බැහැර කිරීම මෙම පද්ධතිය හරහ සිදු කරනු ලබයි.

මෙම අත්‍යාවශ්‍ය මහජන සේවය ඉටුකරලීම සඳහා හඳුන්වා දුන් e-Slims පද්ධතිය මේ වන විට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන ඩිජිටල් මෙහෙයුම් පද්ධතිය වන අතර සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල, පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල, ජනාධිපති ලේකම් කාර්යාලය, ඉඩම් අමාත්‍යාශය සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුව ඇතුළු රජයේ ඉඩම් බැහැර කිරීම හා සම්බන්ධ වන ප්‍රධාන ආයතන කිහිපයක් සම්බන්ධවෙමින් මාර්ගගත ක්‍රමය ඔස්සේ රජයේ ඉඩම් සම්බන්ධ සියලුම කටයුතු මෙම පද්ධතිය හරහා සිදුවේ.

2013 වර්ෂයේදී බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 කින් ආරම්භ වූ මෙම වැඩසටහන 2025 වර්ෂය අවසන් වන විට දිවයිනපුරා මහවැලි අධිකාරියට අයිති ඉඩම් හා රජය සතු ඉඩම් නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨශ හැර අනෙකිත් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යල මෙම පද්ධතිය හා සම්බන්ධවෙමින් ඉඩම් රාජකාරි කටයුතු සිදු කරනු ලබයි.

e-Slims පද්ධතිය හරහා රජය සතු ඉඩම් බැහර කරනු ලබන ආකාරයන් පහත පරිදි වේ.

I. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම
II. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර නිකුත් කිරීම
III. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මධ්‍යම පාංතික ඉඩම් දීමනාපත්‍ර නිකුත් කිරීම
IV. රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිදහස් දීමනාපත්‍ර සකස් කිරීම
V. රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදු නිර්දේශ සකස් කිරීම සහ බදු කර සකස් කිරීම
VI. රජයේ ඉඩම් ආඥා පනත යටතේ දෙපාර්තමේන්තු සහ පලාත් පාලන ආයතන සඳහා ඉඩම් ලබාදීම
VII. රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාර්ෂික අවසරපත්‍ර නිකුත් කිරීම
VIII. ඉඩම් කච්චේරි පැවැත්වීම

පසුගිය රජය යටතේ රජයේ ඉඩම් ආඥා පනත හරහා උරුමය වැඩසටහන ලෙස ඇරඹි නිදහස් දීමනාපත්‍ර සකස් කිරීමේ වැඩසටහන යටතේ ආසන්න වශයෙන් නිදහස් දීමනාපත්‍ර 22,000කට ආසන්න ප්‍රමාණයක අයදුම්පත් වලට අදාල සියලුම වැඩකටයුතු මෙම පද්ධතිය හරහා සිදු කරන ලද අතර නව රජය යටතේ හිමිකම නමින් වන නව වැඩසටහන යටතේද එම නිදහස් දීමනා පත්‍ර සකස් කිරීමේ කටයුතු මෙම පද්ධතිය භාවිතයෙන් සිදු කරමින් පවතී.

වර්ෂය	2023	2024	2025
ඉඩම් ලේඛන ඇසුරින් තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම් (ලේඛන සංඛ්‍යාව)	24,492	15,955	12,866
අනුරේඛණ සහිතව ඉඩම්වල ක්ෂේත්‍ර තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම් (ඉඩම් කැබලි සංඛ්‍යාව)	19,178	70,102	31,255
1.ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නව දීමනා පත්‍ර ලබාදීම 2.රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිදහස් දීමනාපත්‍ර ලබා දීම	6,367 0	0 22,432	0 73
බලපත්‍ර සංඛ්‍යාව	722	917	1,035
දීර්ඝ කාලීන බදුකර සකස් කිරීම	435	152	193

2.3 ඉදිරි ඉලක්ක

2.3.1. 2026 වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂිත අනෙකුත් කාර්යයන්ගේ ඉලක්ක පහතින් දක්වා ඇත.

අංකය	ක්‍රියාකාරකම්		ඉලක්කය
1	**රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් කටයුතු සිදු කිරීම**		
1.1	බදු නිර්දේශ සකස් කිරිම		4000
1.2	බදු නිර්දේශ සංශෝධනය කිරීම		600
1.3	භුක්තියට ප්‍රවේශ වීමට		1500
1.4	දීමනා පත්‍ර සකස් කිරිම		800
1.5	බදුකර සකස් කිරීම		600
1.6	බදු අය කිරීම්		
1.6.1	වර්ෂයේ බදු		
1.6.2	හිග බදු		
2	**ගොවි ප්‍රජාව, අඩු ආදායම් ලාභීන්, හා ව්‍යවසායකයින් උදෙසා ඉඩම් බැහැර කිරීම**		
2.1	ඉඩම් නොමැති පුද්ගලයන් සඳහා ඉ.සං.ආ. පනත යටතේ **බලපත්‍ර නිකුත් කිරිම -අන්තර් පළාත්**	ගොවි පන්තිය	3300
		ගැනුම් මිළ	680
	බලපත්‍ර සකස් කිරීම - පළාත් සභා	ගොවි පන්තිය	15000
		ගැනුම් මිළ	2000
	එකතුව		20980
2.2	මධ්‍යම පාන්තික දීමනා පත්‍ර සකස් කිරීම		100
2.3	පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර		10000
3	**රාජ්‍ය/අර්ධ රාජ්‍ය/විහාරස්ථාන/සමිති හා අනෙකුත් ආයතන වලට ඉඩම් බැහැරකිරීම**		
3.1	රජයේ ආයතන සඳහා ඉඩම් නිදහස් කිරීම - පැවරුම් නියෝග		150
3.2	රජයේ ආයතන සඳහා ඉඩම් නිදහස් කිරීම - දෙපාර්තමේන්තු සඳහා ඉඩම් නිදහස් කිරීම		750
3.3	පූජා භූමි දීමනා පත්‍ර සකස් කිරීම		50
3.4	නාගරික සංවර්ධන අධිකාරිය/ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා ඉඩම් පැවරීම (දීමනා පත්‍ර)		50

3.5	සුනාමි දීමනා පත්‍ර සකස් කිරීම	1500
3.6	නියාදන සාධන පත්‍ර සකස් කිරීම	75
4	**ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම**	170
5	**කච්චේරි**	300
6	**ඉදිරිපත් වන සියළු ගැටළු සඳහා උපදෙස් විසඳුම් ලබා දීම**	
7	**පුහුණු වැඩසටහන්**	25
8	**රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය හා සම්බන්ධ කටයුතු**	
8.1	පුහුණු වැඩසටහන්	30
8.2	දත්ත ඇතුළත් කිරීම	50000
8.3	මෘදුකාංග සංවර්ධනය හා වෙනත්	
9	ලේඛන පරිලෝකනය හරහා ඉඩම් වාර්තා ඩිජිටල් කරණය	50000
10	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	
11	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	

චන්දන රණවීර ආරච්චි
ඉඩම් කොමසාරිස් ජනරාල්
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

....

ආයතන ප්‍රධානී
නම : චන්දන රණවීර ආරච්චි
තනතුර : ඉඩම් කොමසාරිස් ජනරාල්
දිනය : 2026.02. 18

3. පරිච්ඡේදය
වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2024		සටහන	තත්‍ය 2025	තත්‍ය 2024	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1			ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2			ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3			ඒසීඒ-1
200,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	272,469,434	148,383.339	
200,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		272,469,434	148,383.339	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		408,090,000	427,724,000	**ඒසීඒ-3**
-	තැන්පතු		51,978,097	13,294,493	**ඒසීඒ-4**
26,000,000	අත්තිකාරම් ගිණුම්		26,761,280	24,605,452	**ඒසීඒ-5/5(ඒ)/5(බී)**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
26,000,000	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**486,829,377**	**465,623,945**	
226,000,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**759,298,811**	**614,007,284**	
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)**		284,117,304	162,705,229	
226,000,000	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)**		**475,181,507**	**451,302,055**	

	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
536,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	528,396,143	461,701,594	
165,350,230	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	119,890,485	119,744,480	
2,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	1,359,160	1,511,779	**ඒසීඒ-2(ii)**
-	පොළී ගෙවීම්	**8**	-	-	
2,149,770	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	1,428,175	530,350	
706,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**651,073,963**	**583,488,203**	
	මූලධන වියදම්				
25,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	24,190,387	21,487,111	
41,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	23,913,939	10,738,307	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසීඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
3,000,000	හැකියා වර්ධනය	**14**	2,839,030	987,400	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
70,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**50,943,356**	**33,212,818**	
	තැන්පතු ගෙවීම්		61,623,316	53,924,816	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		30,752,015	30,275,530	**ඒසීඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
-	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**92,375,331**	**84,200,346**	
776,000,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		**794,392,650**	**700,901,367**	
(550,000,000)	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(319,211,143)**	**(249,599,312)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(319,211,143)**	**(249,599,312)**	**ඒසීඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසීඒ-3**
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	**2025**	**2024**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,538,501,593	2,354,662,055
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	66,405,302	62,414,567
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		
මුළු වත්කම්		**2,604,906,895**	**2,417,076,622**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		65,743,459	52,107,505
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,538,501,593	2,354,662,055
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	661,843	10,307,062
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		
මුළු වගකීම්		**2,604,906,895**	**2,417,076,622**

පිටු අංක 01 සිට 31 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 32 සිට 41 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38(1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත්, මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත්, ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ඩී.පී. වික්‍රමසිංහ **ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්,** **ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය** **2026.03. 11**	ගණන්දීමේ නිලධාරි චන්දන රණවීර ආරච්චි **ඉඩම් කොමසාරිස් ජනරාල්** **2026.02. 26**	ප්‍රධාන ගණකාධිකාරි පී.ඩී.ආර්. කාවින්ද **2026.02. 25**
ඩී.පී. වික්‍රමසිංහ ලේකම් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය "මිහිකත මැදුර" ඉඩම් මහ ලේකම් කාර්යාලය අංක.1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල	චන්දන රණවීර ආරච්චි ඉඩම් කොමසාරිස් ජනරාල් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මිහිකත මැදුර ඉඩම් මහ ලේකම් කාර්යාලය 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.	පී.ඩී.ආර්. කාවින්ද ප්‍රධාන ගණකාධිකාරි ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව "මිහිකත මැදුර " ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන		
		2025	**2024**
		රු.	රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
මුළු බදු ලැබීම්		272,473,909	149,239,817
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		33,062,493	74,299,519
අග්‍රිම ලැබීම්		408,090,000	427,724,000
අත්තිකාරම් අයකර ගැනීම්		17,684,774	16,305,195
තැන්පතු ලැබීම්		51,978,097	13,294,493
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**783,289,273**	**680,863,024**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		375,568,181	338,121,853
සහනාධාර සහ මාරුකිරීම්		888,131	939,660
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		5,022,599	78,894,487
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		284,117,304	162,705,229
අත්තිකාරම් ගෙවීම්		21,232,455	20,572,047
තැන්පතු ගෙවීම්		61,623,316	53,924,816
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**748,451,989**	**655,158,092**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		**(34,837,287)**	**(25,704,932)**
<u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>			
පොළී		-	-
ලාභාංශ		-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උපණය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)		**-**	**-**

<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>

මූලධන වියදම්	34,837,287	25,704,932
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**34,837,287**	**25,704,932**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(34,837,287)**	**(25,704,932)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඈ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව 2024	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.03	ඉඩම් හා අනෙකුත් බදු කුලී	156,000,000	200,000,000	272,469,434	136.23%

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	706,000,000	706,000,000	651,073,963	92.22%
ප්‍රාග්ධන	70,000,000	70,000,000	50,943,356	72.78%

3.6 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ දිස්ත්‍රික් ලේකම්	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන	තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ප්‍රතිශතය
1	ඉඩම් අමාත්‍යාංශය	ගිනි නිවීමේ සේවාව	63,375.83	63,375.83	100%
		විදුලි සෝපානය	236,522.34	236,522.34	100%
		විදුලි ජනන යන්ත්‍රයට ඉන්ධන	36,841.00	36,841.00	100%
		විදුලි ජනන යන්ත්‍ර පළමු වාර සේවාව			
		PABX අභ්‍යන්තර දුරකථන පද්ධතිය			
		බිම් සවිය	870,833.04	825,043.24	94.74%
		මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සේවා කිරිම	709,592.14	709,592.14	100%
		ජෙනරේටරය වාර සේවා කිරීම	188,800.00	188,800.00	100%
2	ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව	මධ්‍යම වායු සමීකරණ පද්ධතිය සේවා කිරීම	709,592.14	709,592.14	100%
		අභ්‍යන්තර දුරකතන පද්ධතිය			100%
		විදුලි සෝපානය	236,522.34	236,522.34	100%
		ගිනි නිවීමේ සේවාව	63,375.83	63,375.83	100%

		ජෙනරේටරයේ වාර සේවාව	188,800.00	188,800.00	100%
		විදුලි ජනන යන්ත්‍රයට ඉන්ධන	36,841.00	36,841.00	100%
3	විශ්‍රාම වැටුප් ණය ශේෂ නිරවුල් කිරීම	විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ/ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අයකර නිරවුල් කිරීම			
4	බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව	බහුකාර්ය දීමනා ගෙවීම			

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2024** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2025** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,062,978,345.09	1,176,423,145.00		
9152	යන්ත්‍රෝපකරණ	300,242,354.90	113,208,711.60		
9153	ඉඩම්	946,228,807.62	992,249,322.50		
9154	අස්පෘශ්‍ය වත්කම්	19,102,000.00	23,795,000.00		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ	26,110,547.18	35,778,413.59		
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී (විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇමුණුම I මගින් දක්වා ඇත.) ඇතුලත් කරයි.

4. පරිච්ඡේදය
ආයතනයේ කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර 34600 ක් සකස් කිරීම.			57.49
ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර 2000 ක් සකස් කිරීම			0.0
රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බදු නිර්දේශ 4000 ලබාදීම		87.43	
රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදුකර 600 නිකුත් කිරීම		79.17	
නිදහස් දීමනා පත්‍ර 1000 ක් ලබාදීම	103.40		
දෙපාර්තමේන්තු වලට ඉඩම් 750 ක් නිදහස් කිරීම			65.07
නාගරික සංවර්ධන අධිකාරිය / ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා ඉඩම් 50 ක් පැවරීම			50.00
සුනාමි දීමනාපත්‍ර 100 ක් ලබාදීම	758.00		
පූජාභූමි දීමනාපත්‍ර 50 ක් ලබාදීම			54.00
නියාදන සාධන පත්‍ර 75 ක් සකස් කිරීම	114.67		
ජංගම සේවා වැඩසටහන් 20 ක් පැවැත්වීම	370.00		
කච්චේරි 150 ක් පැවැත්වීම	207.33		
රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට දත්ත 70000 ක් ඇතුලත් කිරීම			50.10
පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර			0.0
ගැටළු වලට උපදෙස් ලබාදීම හා ගැටළු නිරාකරණය	100.48		

5. පරිච්ඡේදය
තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
(තිරසාර සංවර්ධන අරමුණු 1.4) විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙලෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියළුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපල උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම			57.49	
	පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර 40000		0.0		
	රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට දත්ත ඇතුළත් කිරීම 70000			50.10	

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2025 වර්ෂයේ දී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීමේ ඉලක්කය 34600 ක් වූ අතර ප්‍රගතිය 57.49% ක් විය. දීමනාපත්‍ර පසු කටයුතු (පසු උරුමය නම් කිරීම,මුලු අයිත්ය සහතික කිරීම,දීමනාපත්‍ර බැහැර කිරීම, උකස් කිරීම කොන්දේසි ලිහිල් කිරීම ඉලක්කය 2000 ක් වූ අතර ප්‍රගතිය 61.05 කි. එමෙන්ම රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය ඔස්සේ බලපත්‍ර සකස් කිරීමේ ඉලක්කය 70,000 ක් වූ අතර ප්‍රගතිය 35,070 ක් වූ අතර 2025 වර්ෂයේ පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම සිදු නොකරන ලදී.

රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් නිකුත් වූ චක්‍රලේඛ සඳහා අනුකූල වෙමින් පවත්නා සීමිත ප්‍රතිපාදන තුළ 2025 වර්ෂයේදී සැලසුම් කරන ලද ඉලක්කයට ළඟාවීමට තරමක් අපහසු විය.

6. පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	කොන්ත්‍රාත් පදනම මත	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	96	35	-	61
තෘතීක	38	8	-	30
ද්විතියික	710	464	1	246
ප්‍රාථමික	121	87	-	34
එකතුව	965	594	1	371

- ජ්‍යෙෂ්ඨ මට්ටම යටතේ පවතින තනතුරු නාම ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල්, අතිරේක ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස්, ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර ඉඩම් කොමසාරිස්, ගණකාධිකාරි, මිනින්දෝරු, නීති නිලධාරි තනතුරු ඇතුළත් වේ.
- තෘතීක මට්ටම යටතේ පවතින තනතුරු නාම ලෙස පරිපාලන නිලධාරී, ජනපද නිලධාරී (විශේෂ), ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි, භාෂා පරිවර්තක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරු ඇතුළත් වේ.
- ද්විතියික මට්ටමේ පවතින තනතුරු ලෙස සංවර්ධන නිලධාරී, වැඩ අධිකාරි, ජනපද නිලධාරි, කළමනාකරණ සේවා නිලධාරි, ක්ෂේත්‍ර උපදේශක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර, තනතුරු ඇතුළත් වේ.
- ප්‍රාථමික මට්ටම යටතේ පවතින තනතුරු ලෙස රියදුරු, කාර්යාල කාර්ය සහායක, කාර්යාල කම්කරු, සංචාරක බංගලා භාරකරු, සංචාරක බංගලා කම්කරු, මැනුම් සහායක, මුරකරු යන තනතුරු ඇතුළත් වේ.

6.2. ආයතනයේ කාර්ය සාධනය සඳහා මානව සම්පත් හිඟය සම්පූර්ණ කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග

මෙම දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවය මත අතිරේක ඉඩම් කොමසාරිස් ජනරාල් තනතුරක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගන්නා ලද අතර උක්ත තනතුරට අදාළව අතිරේක ඉඩම් කොමසාරිස් ජනරාල් වරයෙකු පත් කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් සිදු කරන ලද ඉල්ලීම් වලින් අනතුරුව සහකාර ඉඩම් කොමසාරිස් තනතුරු 2 ක් සඳහා නිලධාරීන් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරන ලදී. එසේම ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් නිරන්තරයෙන් සිදු කරන ලද ඉල්ලීම් වලින් අනතුරුව කළමනාකරණ සේවා නිලධාරීන් 23 දෙනෙකු දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ගැනීමට හැකි වී ඇත. එමෙන්ම,පසුගිය වර්ෂ කිහිපය පුරාම දෙපාර්තමේන්තුගත පත්කිරීම්වල ද සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණයක් පැවතුණි. ඊට මූලිකවම හේතු වී ඇත්තේ ජනපද නිලධාරීන්ගේ පුරප්පාඩු ප්‍රමාණය වේ. ඒ අනුව ජනපද නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩු 58 ක් සම්පූර්ණ කර දෙන ලෙස සහ වැඩ අධිකාරී තනතුරු 02 ක් සඳහා විවෘත පදනමින් නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමට රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරී කමිටුව වෙත ඉල්ලීම් කරන ලදී. තවද, ජනපද නිලධාරී පුහුණු ශ්‍රේණියේ නිලධාරීන් 17 දෙනෙක් ජනපද නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුවේ දැනට පුරප්පාඩු වී ඇති තනතුරු සම්පූර්ණ වීමෙන් පවතින මානව සම්පත් හිඟය මඟ හරවා ගත හැකි අතර එමඟින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය තවදුරටත් ඉහළ නැංවීමට හැකිවනු ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය (2026)

අනු අංකය	පුහුණු වැඩසටහනේ නම	පුහුණුවලත් නිලධාරීන් සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ පරමාර්ථය
				දේශීය	විදේශීය	
01	ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව	01	එක් වසරකි	92,000.00		ඉංග්‍රීසි දැනුම වර්ධනය තුළින් කාර්යාල රාජකාරී පහසු කර ගැනීම
02	- එම -	01	එක් වසරකි	92,000.00		-එම-
03	රජයේ ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	01		138,000.00		රජයේ ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ දැනුම ලබා ගැනීම
04	පශ්චාත් උපාධිය	01	වසර දෙකයි	145,000.00		සේවා ව්‍යවස්ථාව අනුව නිලධාරීන්ගේ උසස්වීම් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා
05	පශ්චාත් උපාධිය	01	වසර දෙකයි	145,000.00		-එම-
06	පශ්චාත් උපාධිය	01	වසර දෙකයි	145,000.00		-එම-
07	පශ්චාත් උපාධිය	01	වසර දෙකයි	105,000.00		-එම-
08	පශ්චාත් උපාධිය	01	වසර දෙකයි	100,000.00		-එම-
09	ජාතික භාෂා	01	පැය 150	10,000.00		දෙමළ භාෂා දැනුම වර්ධනය
10	පරිපාලන නීතිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ පුහුණුව	02	වසරකි	107,000.00		පරිපාලන නීතිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ දැනුම ලබා ගැනීම
11	සාර්ථකත්වයේ රහස	01	එක් දින	9,900.00		ප්‍රධානීන්ගේ විභවයන් මුදාහැරීමට සහ ආයතනික විශිෂ්ඨත්වය ඉහළ නැංවීමට
12	පශ්චාත් උපාධිය	02	වසර දෙකයි	216,900.00		සේවා ව්‍යවස්ථාව අනුව නිලධාරීන්ගේ උසස්වීම් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා
13	පරිපාලන නිලධාරී ධාරිතා සංවර්ධනය	01	තෙදින	18,000.00		පරිපාලන නිලධාරී ධාරිතාව සංවර්ධනය කිරීම
14	ලිපිගොනු කළමනාකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන	27	එක් දින	135,000.00		MSO/DO නිලධාරීන් සඳහා ලිපිගොනු නිවැරදිව සකස් කිරීම, පවත්වාගෙන යාම පිළිබඳ දැනුම ලබාදීම
15	ජනපද නිලධාරී දෙදින පුහුණු වැඩසටහන	56	දෙදින	753,732.00		ජනපද නිලධාරීන්ට අවශ්‍ය දැනුම සෑම අංශයක්ම ආවරණය වන පරිදි ලබා දීම තුළින් දැනම වර්ධනය කිරීම.

16	ජනපද නිලධාරී ත්‍රෛයි මාසික පුහුණුව	01		70,000.00		ජනපද නිලධාරී කාර්යක්ෂමතා කඩඉම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීමට
17	පුද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම පිළිබඳ පුහුණුව	07	දෙදින	91,000.00		පෞද්ගලික ලිපි ගොනුකරණයේ යෙදී සිටින නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම.
18	රජයේ වැටුප් ලේඛන පද්ධතිය	06	තෙදින	126,000.00		ගිණුම් පද්ධතිය පිළිබඳ දැනුම ලබාදීම.
19	විධායකයින් සඳහා නීතිය (DLE)	03		201,000.00		පරිපාලකයින් සහ විධායකයින් සඳහා නීති දැනුම වර්ධනය කිරීම
20	කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා වන රාජ්‍ය පරිපාලනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (මාර්ගගත)	06	මාස 06	119,000.00		කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා වන රාජ්‍ය පරිපාලනය පිළිබඳ දැනුම වර්ධනය කිරීම.
21	දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් සඳහා දෙදින පුහුණු වැඩමුළුව	220	දෙදින පුහුණු වැඩමුළු දෙකක්	76,548.00		කාර්යාල කළමනාකරණය ලිපිගොනු කළමනාකරණය සහ ආයතන සංග්‍රහය සහ විනය පිළිබඳ දැනුම වර්ධකය කිරීම.
22	ධාරිතා සංවර්ධන වැඩසටහන ඉන්දියාව	04	දින 11		541,145.42	මාණ්ඩලික නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය තුළින් ආයතනික අභිප්‍රායන් සාර්ථක කරගැනීම.
23	Climate Resilience Smart Land and Water Management Solutions for Sustainable Agriculture and Environment පුහුණුව- තායිලන්තය	01	දින 15		113,140.87	දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය උදෙසා මාණ්ඩලික නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම.
24	Land Gourmand and Sustainable Urban Development පුහුණුව - කොරියාව	02	දින 10		237,008.50	දෙපාර්තමේන්තුවේ කාර්යය සාධනය උදෙසා මාණ්ඩලික නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම.
				2,712,280.00	891,294.79	

7. පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා රන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)			
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.6	වෙනත්			
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම			

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ. නොවේ.	අදාල අංශ වලින් පිලිතුරු ප්‍රමාද වීම.	එම අංශ දැනුවත් කිරීම.
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
09	**වාහන කළමනාකරණය**			

9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම			
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම			
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම			
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම			
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම			
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		

12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කරයි.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම			
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම			
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබු ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			

17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ		

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

මගේ අංකය / எனது இல. / My No. ARI/E/LCGD/FA/2/25/26 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2026 මැයි 27 දින

ගණන්දීමේ නිලධාරි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ,මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය තුළ අන්තර් පළාත් කාර්යාල වෙත මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වැය විෂයන් 2102,2103 හා 2105 යටතේ රු.8,502,163 ක ප්‍රතිපාදන අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කර ඊට අදාළ වියදම ලෙස රු.7,084,893 ක් එම කාර්යාල විසින් මු.රෙ. 208 යටතේ වාර්තා කර තිබුණි.කෙසේ නමුත් මෙම දරන ලද වියදමින් මූලධන වියදම් අත්පත් කර ගැනීම ලෙස ප්‍රාග්ධනිත කර ඇති වටිනාකම රු.215,393 ක් පමණක් වන අතර ඉතිරි රු.6,869,500 ක වටිනාකමින් යුත් වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණු බැවින් ආයතනයේ වත්කම් අඩුවෙන් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය.

(ආ) කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලයේ ඉහළ මහළ ඉදිකිරීම සඳහා පළමු අදියර යටතේ රු.2,100,000 ක ඇස්තමේන්තුවක් හා දෙවන අදියර යටතේ රු.1,934,315 ක ඇස්තමේන්තුවක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් ඉදිරිපත්කර ඒ අනුව 2024 හා 2025 වර්ෂයන් තුළදී රු.4,634,315 ක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්වරයා වෙත 286-2-1-2001 වැය විෂය යටතේ ප්‍රතිපාදන නිදහස්කර තිබුණි. නමුත් මෙම ඉදිකිරීම නව ඉදිකිරීමක් වුවත් මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් යටතේ වැය

කිරීම හේතුවෙන් එම වියදම ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර නොමැති අතර ප්‍රාග්ධන වියදම් අත්පත් කර ගැනීම් යටතේ ප්‍රතිපාදන වෙන්කර ගැනීමට හෝ මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරුකර වියදම දැරීමට කටයුතුකර නොමැති බවද නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය.

(ඇ) දෙපාර්තමේන්තුවේ රත්මලාන ඉඩම් කළමනාකරන මධ්‍යස්ථානයේ ලිපිගොනු රාක්ක සවිකිරීම සඳහා 2025 වර්ෂයේදී රු.1,306,207 ක් ද 2023 වර්ෂයේදී රත්මලාන ලෝක ආහාර ගබඩාව සඳහා ලිපිගොනු රාක්ක සවි කිරීම සඳහා රු.995,357 ක් ලෙස මුළු වටිනාකම රු.2,301,564 ක් වැය කර තිබුණි. මෙම රාක්ක සවිකිරීම වත්කම් අත්පත් කර ගැනීමක් වුවත් වියදම දරා ඇත්තේ 286-2-1-2001 වැය විෂය මගින් නිසා මෙම වියදමද ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර නොමැති අතර ප්‍රාග්ධන වියදම් අත්පත් කර ගැනීම් යටතේ ප්‍රතිපාදන වෙන්කර ගැනීමට හෝ මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරුකර වියදම දැරීමට කටයුතුකර නොමැති බවද නිරීක්ෂණය විය. එම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම අගයෙන් අඩුවෙන් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1. ආදායම් කළමනාකරණය

(අ) 2025 දෙසැම්බර් 31 දිනට ඉඩම් බදු කුලී ආදායම් ලෙස ලැබුණු රු.272,469,434 ක් වූ රැස්කිරීම් තුළ රු.1,579,970 ක මුදලක් දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම වෙත ලැබී තිබුණද එම මුදල නිවැරදිව මධ්‍යම රජයේ ඉඩම් බදුකුලී ආදායමක්ද යන්න හදුනා නොගෙන විගණිත දිනය වන විට වසරකට ආසන්න කාලයක් ගතවී ඇතත් එම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අන්තර් පළාත් කාර්යාල 08 හි 2025 දෙසැම්බර් 31 දින වන විට හිඟ ඉඩම් බදුකුලී ආදායම වූ රු. 432,244,043 ක් තුළ වර්ෂ 03 කට වඩා වැඩි හිඟ බදු කුලිය රු. 299,526,114 ක් හෙවත් සියයට 69 ක් වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය වන විට හිඟ බදු වටිනාකමින් වර්ෂය තුළදී අයකර ගෙන තිබුණු වටිනාකම රු. 84,775,621 ක් හෙවත් සියයට 19.6 ක් වැනි ඉතා පහළ මට්ටමක ප්‍රතිශතයක් විය.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනයට හිඟ ඉඩම් බදු කුලී ආදායමින් පොළොන්නරුව සහ අම්පාර කාර්යාල වෙනුවෙන් පමණක් පිළිවෙලින් රු.113,591,650 ක් හා රු. 193,568,250 ක් වූ අතර එයින් සමාලෝචිත වර්ෂයේ එකතුකර ගත් හිඟ බදු ආදායම පිළිවෙලින් රු.34,186,582 හා රු.32,577,533 ක් හෙවත් සියයට 30 ක් හා 17 ක් විය. ඒ අනුව 2025 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු බදු වටිනාකම පිළිවෙලින් රු.147,844,408 ක් හා රු.192,106,379 ක් සහ හිඟ බදුකරුවන් පිළිවෙලින් 457 හා 224 ක් සම්බන්ධව නීති අංශය මගින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැතිබව නිරීක්ෂණය විය.

3.2 වියදම් කළමනාකරණය

2025 වාර්ෂික අයවැය ලේඛනය සැකසීමේදී මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණව හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වෙනත් කටයුතු සඳහා ඉන්ධන,නිල ඇඳුම්,වෙනත්,රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා මෘදුකාංග සංවර්ධන යන වැය විෂයන් 05 කට අදාළව වෙන්කරන ලද රු. 51,845,230 ක ප්‍රතිපාදන වලින් රු.34,288,475 ක් හෙවත් සියයට 50 කට වඩා ප්‍රතිපාදන ඉතිරිවී තිබුණු බව නිරීක්ෂණය විය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

	නීති රීති හා රෙගුලාසිය	අනුකූල නොවීම
(අ)	**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**	
	2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 262/2017 හි 4 වගන්තිය	2018 වර්ෂය හා ඉදිරි වර්ෂවල මරණ පාරිතෝෂිත ලබාදී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය ශේෂයක් තම ආයතනවල අත්තිකාරම් බී ගිණුමේ ඇතුළත් නොවීමට ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගත යුතුය යන්න සඳහන් කර තිබුණද 2025 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01ට අඩු කාලයක් තුළ මිය ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 103,120 ක ණය ශේෂයක් සහ වර්ෂ 01 – 03 අතර මියගිය නිලධාරීන් තිදෙනෙක් ගෙන් අයවිය යුතු රු.334,262 ක ණය ශේෂය විගණිත දින වන 2025 දෙසැම්බර් 31 දින වන විටද අයකරගෙන නොතිබුණි.
(ආ)	1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනතේ 217 (2) වගන්තිය	රජයේ ඉඩම් බදු දීමේදී අය කළ යුතු බදු ප්‍රමාණ බද්ද සංශෝධනය වන කාලය හා බදු ලබා දිය හැකි කාල සීමාව සඳහන් කර ඇත. ඒ අනුව කෘෂිකාර්මික, වාණිජ, නේවාසික පදනම මත බදු ලබා දීමේදී බදු කාලසීමාව වසර 30 කට පමණක් ලබාදිය යුතු නමුත් බස්නාහිර පළාතට අයත් බදුකරුවන් 22 දෙනෙකු සඳහා ඉඩම් අක්කර 179 ක් පමණ වර්ෂ 99 ක් සඳහා බදු දී තිබුණු බව නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1.1 කාර්යසාධනය

ජාතික ප්‍රතිපත්තියක් තුල මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනයේ චිරස්ථායී බව සහතික කරමින් රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් සහතික කිරීමට මඟ පෙන්වමින් නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරීත්වයක් පවත්වා ගෙන යෑම දෙපාර්තමේන්තුවේ 'මෙහෙවර' ලෙස දක්වා ඇතත්, ඉඩම් පිළිබඳ තොරතුරු හා දත්ත ලබාගැනීමේදී දෙපාර්තමේන්තුව තුළ ඉඩම් බදුදීම්, ඉඩම් බැහැර කිරීම්, දීමනාපත්‍ර ලබාදීම, බදු නිදහස් කිරීම, බදු

සහන ආදී තොරතුරු ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් මෙම වාර්තාවේ දින වන විටද සකස්කර නොතිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (E-slims) 2016 වසරේදී ආරම්භ කර වසර 05 ක කාලයක් තුළදී රු. මිලියන 119.6 ක ඇස්තමේන්තුවක් මත පද්ධතිය හා සම්බන්ධ සියලු කාර්යයන් අවසන් කිරීමට සැලසුම් සකස් කර තිබූ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1 වන පරිච්ඡේදයේ 1.1 හා 1.2.1 ඡේදයන්හි සඳහන් වන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු නොවීම නිසා මෙම පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට නොහැකි වී තිබුණි. 2013 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රු. මිලියන 208.16 ක් මෙම කාර්යය සඳහා රජයේ මුදල් වැය කර ඇතත් රජයේ ඉඩම් කළමනාකරණය කිරීමට හා බදු මුදල් අයකර ගැනීමට පහසු වන පරිදි මෙම පද්ධතිය සංවර්ධනය වී නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුව විසින් අලුත්වැඩියා කටයුතු කරමින් හෝ පහසුකම් සපයමින් පවත්වාගෙන යන සංචාරක බංගලා 8 න් 5ක් පමණක් මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.29,931,500 ක් ලෙස ගිණුම් ගත කර ඇති අතර මෙම සංචාරක බංගලා පිහිටි ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමක් කර පොත්වල වාර්තා කර නොමැත. එසේම එම සංචාරක බංගලා සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරයා ගෙන් පැවරීමේ සහතිකයක් මගින් භුක්තිය විධිමත්ව පවරාගැනීමට කටයුතු කර නොමැති අතර ගොඩනැගිලි සැලසුම් සකස් කර අනුමැතීන් ද ලබාගෙන නොතිබුණි.

(ආ) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට අයත් රත්මලාන ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිල්ලක් ශ්‍රවණාගාරයක් බවට පත්කිරීම සඳහා රු. මිලියන 4.59 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණි. තවද, එම ගොඩනැගිල්ල වෙත රු. මිලියන 12.99 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩද හා වායු සමීකරණ යන්ත්‍ර 04 ක්ද සවිකර තිබුණි. එම ගොඩනැගිල්ලේම කොටසක් පරිගණක මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා රු. මිලියන 5.58 ක මුදලක් වැය කරමින් පරිගණක හා උපාංග මිලදීගෙන තිබූ නමුත් මෙම ශ්‍රවණාගාරය හා පරිගණක මධ්‍යස්ථානය ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

4.3 පාඩු හා හානි

(අ) ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මුහුදෙන් වැලි ගොඩබිමට ඉවත් කිරීමේ ගිවිසුමක් 2018 ජනවාරි 16 දින විදේශීය සමාගමක් සමඟ අත්සන් කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ මුහුදු වැලි අලෙවි කර සංස්ථාව විසින් රු.මිලියන 6,778.04 ක් ආදායම් උපයාගෙන තිබුණි. නමුත් 1957 රාජ්‍ය සන්තක ඉඩම් පිළිබඳ ආඥා පනතේ 08 වැනි කාණ්ඩයේ 58 සිට 67 දක්වා වගන්තිවලට අනුව මුහුදු පතුලෙන් යම් ද්‍රව්‍යයක් ලබා ගන්නේ නම් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අනුමැතිය අනුව සිදුකළ යුතු බව සඳහන්ව ඇති අතර ඒ සඳහා ගාස්තුවක් අය කළ යුතු බවද සඳහන් වී තිබුණි. නමුත් රු.මිලියන 6,778.04 ක් වූ වටිනා වැලි ඉවත් කිරීමේදී ලබාගත් අනුමැතියක් හෝ යම් මුදලක් රජයට අයකර ගත් බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. ඒ අනුව මෙම ක්‍රියාවලියේදී අවම වශයෙන් රු.මිලියන 271.1 කට ආසන්න පාඩුවක් රජයට සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 93, ඩී අක්කර පනහ ග්‍රාම නිලධාරී වසමේ GA/KAT/2020/281 අනුරේඛණයේ කැබලි අංක A 01හි හෙක්ටයාර 2.1081 ක රජයේ ඉඩම පුද්ගලික අධ්‍යාපන ආයතනයක් වෙත 2023.04.11 දින සිට වසර 30 ක් සඳහා 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු තක්සේරු වටිනාකමින් සියයට 0.5 ක බදු අයකිරීමකට යටත්ව අනුමැතියලබා දී තිබුණද මෙම ආයතනය සමාගම් පනත යටතේ ලියාපදිංචි වාණිජ අරමුණකින් ක්‍රියාත්මක වන මුදල් අයකරමින් අධ්‍යාපනය ලබාදෙන ආයතනයක් බව විගණනයේදී තහවුරු විය. ඒ අනුව බදු මුදල සියයට 4 ක වටිනාකමක් අයනොකර සියයට 0.5 ක බදු ප්‍රතිශතයකට ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. ඉඩමේ වාර්ෂික බදු මුදල රු.1,250,000ක් බව දක්වා තිබුණු අතර ඉඩමේ නොදියුණු වටිනාකම වන රු.250,000,000 න් සියයට 4 ක බදු මුදලක් අය නොවීම මත 2026.04.11 දිනට රජයට සිදු වූ පාඩුව රු.35,000,000 ක් බව නිරීක්ෂණය වේ.

(ඇ) මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 03 දෙල්වල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මුකලන්හේන නොහොත් බුලනෙකන්ද වත්ත නැමති ඉඩමෙහි පෞද්ගලික ආයතනයක් විසින් 2011 සිට 2020 වර්ෂය දක්වා කෘෂිකාර්මික පදනම මත බදු දී ඇති ඉඩම් කොටස වන 510293 කලාප 11 කැබලි අංක 159 හි අනවසරයෙන් කළුගල් කියුබ් 111,197 ක් කැඩීම වෙනුවෙන් රු.25,750,000 ක් ද, බදු දී නොමැති ඉඩම් කැබලි අංක 160 හි කළුගල් කියුබ් 47,520 ක් කැඩීම වෙනුවෙන් රු.11,000,000 ක් ලෙස එකතුව රු.36,750,000 ක් රජයට ගෙවිය යුතු වුවත් එම මුදල් මේ දක්වා ගෙවා නොමැත. එසේම භූවිද්‍යා හා සමීක්ෂණ කාර්යංශයට අයවිය යුතු රාජ්‍ය භාගය රු.මිලියන 6.4 ක් ඇතුළුව එකතුව රු.මිලියන 43.15 ක් ඉහත නම් සඳහන් පුද්ගලික ආයතනය විසින්, රජයට ගෙවීම පැහැර හැර තිබුණි. එසේම රාජ සන්තක ඉඩම් පිළිබද ආඥාපනතේ 6(3) වගන්තිය ප්‍රකාරව හා ඉඩම් අඥා පනතේ 212 වගන්තිය ප්‍රකාරව කොන්දේසි කඩන බදුකරුවන්ට විරුද්ධව කටයුතු කර බද්ද අවලංගු කිරීමට හෝ ඔහුට විරුද්ධව නඩු පැවරීමට පියවර ගත යුතු වුවත් ඉඩම් ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොමැතිබව නිරීක්ෂණය විය.

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වාණිජ පදනමින් දීර්ඝ කාලීන බදු දී ඇති ඉඩම් ගොනු අතරින් දීර්ඝ කාලීන වාණිජ බදු ගොනු 82 ක් (2021 පෙබරවාරි 01 දිනැති අංක 2020/06 (1) චක්‍රලේඛය ප්‍රකාරව දෙවන බදු කාලය ආරම්භ වන), පැවතුනු අතර ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2022 නොවැම්බර් 10 දිනැති අංක 4/10/ පොදු / බදු සහන (L2) ලිපියෙහි සඳහන් පරිදි බදු ගොණු 08ක් සම්බන්ධයෙන් බදු සහන ලබා දී තිබීම නිසා රජයට රු.70,518,510 ක බදු මුදලක් අහිමි වී තිබුණි.

(ආ) පෞද්ගලික ආයතනයක් වෙත සාත්තු නිවාසයක් පවත්වා ගෙන යාම සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අක්කර 02 රූඩ් 01 පර් 3.81 ක් වූ රජයේ ඉඩම නොදියුණු වටිනාකමින් සියයට 0.5 ක වාර්ෂික බදු වටිනාකමකට දීර්ඝකාලීනව බදු දී මෙම ඉඩම සඳහා නොදියුණු වටිනාකමක් සියයට 02 ක බදු ප්‍රතිශතයකට වසර 30 ක කාලයක් සඳහා බදු ලබා දීමට අංක PS/CSA/00/5/1/1/27 දරන හා 2019 සැප්තැම්බර් 12 දිනැති ලිපිය මගින් එවකට අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමැතිය ලබාදී තිබුණි. නමුත් මෙම බදුගත් ඉඩමෙහි ලාභ ලබමින් වාණිජ පදනමින් ක්‍රියාත්මක වන පුද්ගලික රෝහලක් බව සනාථ කිරීමට පැහැදිලි සාක්ෂි තිබියදී ඒ අනුව කටයුතු නොකිරීම නිසා 1971 වර්ෂයේ සිට මේ දක්වා නොදියුණු වටිනාකම මත සියයට 4 බැගින් බදු අය නොකිරීම නිසා දළ ඇස්තමේන්තුගත බදු ආදායම රු.1,723,165,512 ක් රජයට අහිමිවී තිබුණි. ඊට අමතරව පවත්නා ගිවිසුම් අනුව ගෙවිය යුතු බදු මුදල් නොගෙවීම මත ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙහි ගණනය කිරීම් අනුව 2024.12.31 දින වන විට බදු

ගැනුම්කරු විසින් පැහැරහැර ඇති බදු වටිනාකම රු.214,017,900 ක් විය. තවද ගිවිසුම් එකඟතාවලට පටහැනිව 2023 අප්‍රේල් 01 දින සිට මෙම ආයතනය විසින් එහි කළමණාකාරිත්වය බදු දීමනාකරුගේ අනු දැනුමකින් තොරව වෙනත් පෞද්ගලික සමාගමක් වෙත රෝහල භාරදී ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව බදු ගැනුම්කරු විසින් බදු කොන්දෙසි කඩකරමින් ක්‍රියා කිරීම මත ඉඩම් ආඥා පනතේ 6(3) එහා 212 යන වගන්ති ප්‍රකාරව හා 2023.12.13 දින දෙපාර්ශවය සමඟ ඇති කරගත් බදු ගිවිසුමෙහි 18(III) කොන්දෙසි ප්‍රකාරව ද බදු ගිවිසුම අවලංගු කරමින් සන්තකයට පවරා ගැනිමට බදු දේපළ හිමිකරුට හැකියාව පැවතිය ද එලෙස කටයුතු කර නොතිබීම මත රජයට සිදුවන පාඩුව දිගින් දිගටම වැඩිවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 61 ක්ද, තෘතියික කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 30 ක්ද, ද්විතියික කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 246 ක්ද සහ ප්‍රාථමික කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 34 ක්ද වශයෙන් සමස්ත පුරප්පාඩු 371 ක් පැවතුණි.

පී.කේ.එම්.පී.නෝනිස්

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පී.කේ.එම්.පී. නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය